# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

## ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (මධ්‍යම පළාත) සභාපති විසින්. මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. කොන්ත්‍රාත්තුවේ විස්තර

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | දිස්ත්‍රික්කය | කොන්ත්‍රාත්තුවේ නම | ඉංජිනේරු ඇස්තමේන්තුව (අවිනිශ්චිත වියදම් රහිතව හා 20 % ලාබාංශ සහිතව) රුපියල් මිලියන | CIDA ශ්‍රේණිය | ලංසු ආරක්ෂණය (රුපියල්) | කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර දින) | ආපසු නොගෙවනු ලබන ලේඛණ ගාස්තු (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | SMRR/RBP/SD&CC /CP/KY/01/R1 | මහනුවර | හුන්නස්ගිරිය මීමුරේ මාර්ගයේ හිත්ගග හරහා ඇති පාලම ඉදි කිරීම. (ඉතිරි වැඩ කොටස්) | 2.87 | C7, C8 පාලම් | 46,500.00 | 60 | 1,300.00 |
| 2 | SMRR/RBP/SD&CC /CP/KY/02/R1 | මහනුවර | පුපුරැස්ස නුවරඑළිය මාර්ගයේ මුල්ගම පාලම ඉදි කිරීම. (ඉතිරි වැඩ කොටස්) | 13.8 | C5,C6 පාලම් | 178,500.00 | 120 | 4,400.00 |
| 3 | SMRR/RBP/CP/NE/ 06/R1 | නුවරඑළිය | මීපිලිමාන දිමුතුගම මාර්ගයේ පාලම ඉදි කිරීම. (ඉතිරි වැඩ කොටස්) | 25.86 | C4,C5 පාලම් | 200,700.00 | 210 | 7,400.00 |
| 3 | RDA/CP/PD/2024/10 | මහනුවර | ගෝම්රේ මාර්ගයේ (0+000-2+000 ) කි.මී. වෙත අවශ්‍ය ඇස්ෆෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 775 ක් ප්‍රවාහනය කර සපයා දීම. | 18.68 | - | 280,000.00 | 90 | 5,800.00 |
| 3 | RDA/CP/PD/2024/11 | මහනුවර | ගෝම්රේ මාර්ගයේ (2+000-3+660 ) කි.මී. වෙත අවශ්‍ය ඇස්ෆෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 525 ක් ප්‍රවාහනය කර සපයා දීම. | 12.65 | - | 190,000.00 | 90 | 4,500.00 |

03. මෙම ප්‍රසම්පාදනය ජාතික තරගකාරී ලංසු තැබීම (NCB) හරහා සිදු කෙරේ. මෙම ප්‍රසම්පාදනය යටතේ (වැට් බදු සහ අනෙකුත් බදු හැර) සිදුකිරීමට නියමිත වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මි. 50 ට අඩු බැවින් රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛණයේ අංක 04/2016 (iii) හි කලාපීය මනාපය සහ CIDA ශ්‍රේණියේ මනාපය සලකනු ලැබේ.

04. ලංසුව, ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර **2024.07.18 දින දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය.** ලංසු ආරක්ෂණයක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් ඉහත වගුවේ දක්වා ඇති පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අදාළ ශ්‍රේණියේ ලියාපදිංචි වී සිටිය යුතුය.

06. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.03.27** දින සිට පහත සඳහන් කාර්යාල වලින් ලංසු ලේඛණ පරීක්ෂා කිරීම සිදු කළ හැකි අතර **2024.03.27 වන දින සිට 2024.04.17** දක්වා 9.00 පැය සිට 15.00 පැය අතර කාලයේදී පහත සඳහන් කාර්යාල වලින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

- ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැදුර", ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
  දු.ක. අංකය - 011-2884790 ෆැක්ස් - 011- 2884790 විද්‍යුත් තැපැල් - procurement@rda.gov.lk

- පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය(ම.ප), මාර්ග සංවර්ධන අධිකාරිය, අස්ගිරිය,. මහනුවර.
  දු.ක. අංකය - 0812-226150 ෆැක්ස් - 0812-237931 විද්‍යුත් තැපැල් - pdcentral123@gmail.com
  0812-232119

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. අස්ගිරිය. මහනුවර
  දු.ක.අංකය - 0812-222005 ෆැක්ස් - 0812-222005 විද්‍යුත් තැපැල් - cekandyrda@gmail.com

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. නුවරඑළිය
  දු.ක.අංකය - 052-2222552 ෆැක්ස් - 052-2222553 විද්‍යුත් තැපැල් - nuwaraeliyace@gmail.com

07. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් මහනුවර අස්ගිරියෙහි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලයෙන් ලංසු ලේඛණ කාර්යාලීය වේලාව තුලදී කිසිදු ගාස්තුවකින් තොරව පරීක්ෂා කිරීම කල හැකි අතර **27.03.2024 දින සිට 2024.04.17** දින දක්වා 9.00 පැය සිට 15.00 පැය කාලය තුල ඉහත වගුවෙහි සඳහන් ආපසු නොගෙවනු ලබන ලේඛණ ගාස්තු ගෙවීම් කරන ලද (බදු සහිතව) රිසිට්පතද සමග ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සම්පූර්ණ අයදුම්පත් කට්ටලයක් පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලය වෙතින් ලබා ගත හැකිය.

08. **2024.04.05** වන දින පෙ.ව. 10.00 ට අදාළ ප්‍රධාන ඉංජිනේරු (මහනුවර/නුවරඑළිය) කාර්යාලයාල වලදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. අස්ගිරිය. මහනුවර
- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. නුවරඑළිය

09. 1987 අංක 3 දරන පොදු පනත අනුව මිලියන 5 ට වැඩි ලංසු සඳහා ලංසුකරුවන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සහතිකය සමග ලංසු ඉදිරිපත් කළ යුතුය.

10. සම්පූර්ණ කල ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුව සහ අංකය සඳහන් කර සභාපති. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව. මාර්ග සංවර්ධන අධිකාරිය. තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර යන ලිපිනයට **2024.04.18 දින 14.00** පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදින **14.30** පැයට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති.**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව(මධ්‍යම පළාත)**
**පළාත්භාර අධ්‍යක්ෂ(ම.ප) කාර්යාලය.**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**
**තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර.**